Copyrighted Material

#1 *NEW YORK TIMES* BESTSELLING AUTHOR

# CLIVE CUSSLER

WITH GRANT BLACKWOOD

## SPARTAN GOLD

# ස්පාටන් රන් දඩයම

MusesBooks

පරිවර්තනය | **විභඟ පියුමාල් ජයකොඩි**

**A Fargo Adventure**

MusesBooks

www.musesbooks.com

Copyrighted Material

# පිවිසුම

**ග්‍රේට් සෙන්ට් බර්නාඩ් කපොල්ල,**
**පෙන්නයින් ඇල්ප්ස්,**
**මැයි, 1800**

හමාගිය මාරුතය සිය පා අවට වූ හිමකැටිති විසුරුවා දැමූවෙන්, ස්ටයිරී නම් අසු පිටකළේ කලබලයට පත් හඬකි. අසරුවා, කිහිපවරක්ම නොසතුටු හඬක් නගමින් මාර්ගයෙන් ඉවතට ගමන් කළ අසු නැවත නිසි මඟට ගත්තේ කලබලයට පත් සත්වයා සන්සුන් කරවමිනි. නැපෝලියන් බෝනපාර්ට් නොහොත් එකී ප්‍රංශ අධිරාජ්‍යයා සිය පුළුල් කබා කර ඔසොවමින්, පැවති හිමපතනය මධ්‍යයේම ඉදිරිය විපරම් කළේය. ඔහුගේ දර්ශන පථය, නැගෙනහිර දෙසින් වූ අඩි දහසය දහසක් උස්ව නැඟි මොන්ට් බ්ලැන්ක් කඳුවැටිය තෙක් සීමා විය.

සැදලයේ ඉදිරියට නැඹුරුවුණු ඔහු ස්ටයිරීගේ ගෙල පිරිමැද්දේය. "මීට අන්ත දේවල් උඹ දැකලා තියෙනවා මිත්‍රයා."

විශිෂ්ට යුද අශ්වයෙකු වූ ස්ටයිරී, අරාබිකරයේදී නැපෝලියන් විසින් ග්‍රහණය කරගනු ලැබූවෙකු වූවේය. නමුත් හිම සහ කටුක සීතල උගේ චරිත ලක්ෂණ හා නොගැළපිණි. වැලිකතරේම උපත ලැබ හැදී වැඩුණු උෟ හපන්කම් පෑවේ වැලිකතරේදීම විනා, හිමපලස මතදී නම් නොවීය.

ආපසු හැරුණු නැපෝලියන් ඔහුට අඩි දහයක් පමණ පසුපසින් එකට ගැටගසන ලද කොටළුවන් සමූහයක් රැඳවාගෙන සිටි තම ප්‍රධාන මෙහෙකරුවා වූ කොන්ස්ටන් හට යමක් සන් කළේය. ඔහුටද පසුපසින් දඟරගැසෙමින් වැටුණු මාවතේ ඇත ඉම

www.musesbooks.com

Copyrighted Material



තෙක්ම වූයේ කොටළුවන් හා අසුන් පිට නැඟී ගමන් කරමින් සිටින නැපෝලියන්ගේ හතළිස් දහසක් වූ හමුදා භට බණ්ඩයයි.

එක් කොටළුවෙකු මුදාහළ කොන්ස්ටන්, උඟ පිට නැඟී වහාම නැපෝලියන් අසලට පැමිණියේය. ස්ටයිරීගේ රේන්ස් පටිය ඔහු අතට දී අසුපිටින් බට නැපෝලියන්, සිය දෙපාවල හිරි ඇරගත්තේ දණක් පමණ ගැඹුරැති හිම තට්ටුව මත සිටමය.

"එයාට පොඩි විවේකයක් දෙමු," නැපෝලියන් කීවේය. "අර ලාඩම නිසා කකුල ආපහු රිදෙන්න පටන් අරන් වගේ."

"මං ඒක ගැන බලන්නම්, ජෙනරල්," කොන්ස්ටන් කීය. මව්රටේදී කොන්සල්වරයා යන නමින් තමා ඇමතීම ප්‍රියකළ නැපෝලියන්, මෙහෙයුමක යෙදෙන විට 'ජෙනරල්' යන තනතුරු නාමය අපේක්ෂා කළේය. පෙණහලු පිරීයන පරිදි දීර්ඝ හුස්මක් ගත් හෙතෙම, සිය බිකෝර්න් හිස්වැස්ම මනාව හිස මත රුවාගෙන නෙත් හෙළුවේ ඔවුන් අබිමුව ඉහළට ඇදී තිබෙන ග්‍රැනයිට් ප්‍රාකාරය දෙසටය.

"බොහෝම අපූරු දවසක් නේද, කොන්ස්ටන්?" නැපෝලියන් විමසීය.

"ඔබ කියන දෙයක් තමයි, ජෙනරල්," මෙහෙකරුවා මුරගෑවේය.

නැපෝලියන් තමාටම මඳහසක් පෑවේය. වසර ගණනාවක් මුළුල්ලේ තමා සමග කටයුතු කළ කොන්ස්ටන් යනු, ඔහු උපහාසයට ලක්කිරීමට රුසි වූ පහත නිලයන්වල නිලධාරීන් සුළුතරයෙන් එක් අයෙකි. එහෙත් මහලු මිනිසෙකු වූ කොන්ස්ටන්ගේ ඇටමිදුලු දක්වාම මෙම සීතල කාවදින්නට ඇතැයි ඔහුට සිතුණේ ඉන් අනතුරුවය.

මධ්‍යම ප්‍රමාණයේ උසකින් යුතු නැපෝලියන් බෝනපාර්ට් ශක්තිමත් ගෙලකට සහ පුළුල් දෙවුරකට හිමිකම් කීවේය. ඔහුගේ උල් වූ නාසය සිය දැඩි කරගත් මුවට සහ හතරැස් නිකටට ඉහළින් පිහිටා තිබූ අතර, අවට ජීවී අජීවී සියල්ල විනිවිද දැකිය හැකි අන්දමේ බැල්මක් ඔහුගේ තියුණු අළු පැහැ දෙනෙත සතු විය.

"ලෝරන්ට්ගෙන් තොරතුරක් ලැබුණද?" ඔහු කොන්ස්ටන්ගෙන් විමසීය.

"නැහැ, ජෙනරල්."

නැපෝලියන්ගේ විශ්වසනීයම කමාන්ඩර්වරයා සහ සමීපතම මිතුරෙකු වන ආර්නෝඩ් ලෝරන්ට් හෙවත් මේජර් ජෙනරල්වරයා

MusesBooks

www.musesbooks.com

Copyrighted Material



දිනකට පෙර නිරීක්ෂණ මෙහෙයුමක් සඳහා භට බණ්ඩයක් කැටුව සෙන්ට් බර්නාඩ් කපොල්ල තුළට ගමන් කළේය. මෙම සීමාවේදී සතුරු ප්‍රහාරයකට මුහුණපෑමේ අවදානමක් නොපැවැතියද, නැපෝලියන් ඕනෑම අවස්ථාවක් සඳහා සූදානමින් පසුවීමට ඉගෙන සිටියේ බොහෝ කලකට ඉහත සිටමය. හුදු උපකල්පන යන මුළාවට හසු වී ලොව ශ්‍රේෂ්ඨම මිනිසුන් පවා බිඳවැටී තිබුණේය. කෙසේ නමුදු මෙහිදී නම් ඔහුගේ ප්‍රබලම සතුරා බවට පත්ව සිටියේ භූ විෂමතාව සහ කාලගුණයයි.

අඩි අටදහසක සීමාවේදී සෙන්ට් බර්නාඩ් කපොල්ල ශතවර්ෂ ගණනාවක් මුළුල්ලේ සංචාරකයෝ, හරස් මාර්ගයක් ලෙසින් භාවිත කළහ. ස්විට්සර්ලන්තය, ඉතාලිය සහ එහි පිහිටි බිම වන ප්‍රංශයේ දේශසීමාවට මායිම්ව පිහිටා ඇති පෙන්නයින් ඇල්ප්ස් කඳුවැටිය මීට පෙරද හමුදා බළඇණි සඳහා සාක්ෂි දැරීය. ක්‍රි.පූ. 390දී රෝමය ආක්‍රමණය කළ ගෝල් දේශයේ ආක්‍රමණිකයන්ද, ක්‍රි.පූ. 217දී හැනිබල්ගේ සුප්‍රසිද්ධ ඇත් සවාරිය මෙන්ම, ක්‍රි.ව. 700දී පළමු ශුද්ධ වූ රෝම අධිරාජ්‍යයා ලෙසින් කිරුළු පැළැඳි චාර්ලිමැග්න් සිය පුනරාගමනය සිදු කළේද මෙම කඳුවැටිය හරහාය.

*ප්‍රශංසනීය මිත්‍ර සමාගමයක්,* නැපෝලියන් තනිවම සිතුවේය. එසේම ක්‍රි.ව. 753දී ඔහුට පෙර සිටි ප්‍රංශ රජු වූ පෙපින් ද ෂෝර්ට් පවා දෙවැනි ස්ටීවන් පාප් වහන්සේ බැහැදැකීමේ අරමුණින් මෙලෙස පෙන්නයින් දුර්ගය තරණය කර තිබිණි.

*අතීත් රජවරු බොහෝදෙනෙක් අසාර්ථක වුණා තමයි. නමුත් මම අසාර්ථක වෙන්නෙ නෑ,* ඔහු තමාටම සිහිගන්වාගත්තේය. නැපෝලියන්ගේ අධිරාජ්‍යය, ඔහුට එරෙහි වන සියල්ලන්ගේ නපුරු සිහිනයක ඇතිවාටත් වැඩියෙන් ඔබ්බට පැතිරෙනු ඇත්තේය. ඔහුගේ ගමනට කිසිවෙකුගෙන් හෝ බාධා නොපැමිණෙනු ඇත. සතුරු බළඇණි, කාලගුණය, ගිරිදුර්ගවලට තබා ඔස්ට්‍රියානු ජාතිකයන්ටද කිසිසේත්ම එය කළ නොහැක්කක් වන්නේය.

වසරකට පෙරාතුව, නැපෝලියන් සහ ඔහුගේ භට පිරිස ඊජිප්තුවට එරෙහිව සංග්‍රාමයේ යෙදෙමින් සිටි පසුබිමකදී, කැම්පෝ ෆෝමියෝ ගිවිසුමෙන් ප්‍රංශයට ඈඳාගනු ලැබූ ඉතාලි භූමිය නිර්භය ලෙසින් නැවතත් ලබාගැන්මට ඔස්ට්‍රියානු ජාතිකයෝ සමත් වූහ. එහෙත් ඔවුන්ගේ එම ජයග්‍රහණය කෙටිකාලීන ජයක් පමණක් වීමට නියමිතව තිබිණි. ප්‍රතිප්‍රහාරයක් මෙතරම් ඉක්මනින් එල්ලවනු

www.musesbooks.com

Copyrighted Material



ඇතැයි, ඔවුන් කිසිවිටෙකත් අපේක්ෂා නොකරනු ඇත. ඉහළට නැගුණු පාෂාණමය කුළුවලින් සහ දඟරගැසුණු මාවතින් යුතු පෙන්නයින් කඳුකරය, හතළිස් දහසකින් යුත් හමුදාවකට තබා සංචාරකයන්ට පවා භූ විෂමතාව අතින් බිය උපදවන්නක් වූවේය. සැප්තැම්බරයේ සිට කපොල්ලේ අඩි තිහක පමණ හිමපතනයක් දක්නට ලැබුණු අතර, උෂ්ණත්වයද පහළ බැස තිබුණේ අංශක බිංදුවද ඉක්මවා යමිනි. මිනිසුන් දසදෙනෙකු තරම් උස් වූ හිම ප්ලාවිතයන් හැමවිටම ඔවුන් පිස හමාගියේ, ඔවුන් සහ ඔවුන්ගේ අසුන් හිම යට වළලා දැමිය හැකි බවේ තර්ජනයද නිරන්තරයෙන්ම සිහිපත් කරවමිනි. හිරුරශ්මිය ඇති දිනයන්හිදී පවා, මධ්‍යාහ්නය එළැඹෙන තුරුම පොළෝ මට්ටමත් මීදුමෙන් වැසී තිබිණි. සුළි කුණාටුද නිරතුරුවම පාහේ පෙරනිමිත්තකුදු නොමැතිවම හමායන්නට වූයේ ශාන්ත ලෙස පැවැති දිනයක් පවා ඔවුන්ගේ දෙපා පිහිටීමේ සිට යාරයක දුරක්වත් ඉදිරිය දැකිය නොහැකි අයිස් සහ හිමෙන් වැසුණු බියකරු සිහිනයක් බවට හරවමිනි. මේ සියල්ලට වඩා භයානකම අන්තරාය වූවේ, හිම කඩාහැලීමයි. සැතපුම් භාගයක් පමණ පුළුල් හිම කඩාවැටීම් ඉහළ කඳුකරයේ සිට පහළට ඇදහැලෙන්නේ, ඊට හසුවන සියලු අවාසනාවන්තයන් සදාකාලිකවම හිම යට මිහිදන් කරවමිනි. මේ වනතෙක් නැපෝලියන්ගේ බණ්ඩයේ දෙසිය දෙනෙකු හැර සෙසු සියල්ලන්ම ඒ උපද්‍රවයෙන් නිරුපද්‍රිතව තැබීමට තරම් දෙවියන් වහන්සේ කාරුණිකව සිටියේය.

ඔහු කොන්ස්ටන් වෙත හැරුණේය. "ක්වාටමාස්ටර්ගේ වාර්තාව?"

"මෙන්න ජෙනරල්." තම කබාය තුළ රුවාගෙන සිටි කඩදාසි ගොනුවක් පිටතට ගත් හෙතෙම, එය සොල්දාදුවන් නිරීක්ෂණය කරමින් පසු වූ නැපෝලියන් අත තැබීය. ඔහුගේ යුද සේනාංකය සැබෑම සංග්‍රාමයේ නියැළී තිබුණේ උදරයට එරෙහිවය. මේ වන තෙක් ඔවුන් පරිභෝජනය කර තිබූ ආහාර ප්‍රමාණය අතරට වයින් බෝතල් දහනවදහස් අටසිය දාහතක්, චීස් ටොන් එකක් සහ මස් රාත්තල් එක්දහස් හත්සියයක් අයත් විය.

ඔහුට මඳක් ඔබ්බෙන්, කපොල්ලේ පහළට වන්නට ගමන් කළ ඉදිරිපෙළ අසරුවන් දෙසින් කෑගැසීම් හඬක් නැගුණේ එවිටමය. "ලෝරන්ට්! ලෝරන්ට්..!"

"ඇති යන්තම්," නැපෝලියන් මිමිනීය.

www.musesbooks.com

Copyrighted Material



හමායමින් තිබූ හිමකුණාටුව තුළින් මතුවූයේ අසරුවන් දොළොස්දෙනෙකුගෙන් යුතු කණ්ඩායමකි. ඔවුන්ගේ කමාන්ඩර්වරයා මෙන්ම සවි ශක්තියෙන් හෙබි සොල්දාදුවන් වූ එම අසරුවන්, නැපෝලියන් සතු හොඳම භට බණ්ඩය විය. දැඩි කරගත්ප්‍රතාපවත් මුහුණින් යුතු එම කිසිදු සෙබළෙකුගෙන් වෙහෙසකාරී බවක් දිස් නොවීය. නැපෝලියන් ඉදිරිපිට සිය අසු නවතාගත් ලෝරන්ට්, ඔහුට ආචාර කර අසුපිටින් බැසගත්තේය. ඔහුව වැලඳගත් නැපෝලියන් පියවරක් පසුපසට ගෙන සංඥා කළේ කොන්ස්ටන් හටය. වහාම එදෙසට දිව ආ නැපෝලියන්ගේ මෙහෙකරුවා බ්‍රැන්ඩි බෝතලයක් ඔහුට පිළිගැන්වීය. බ්‍රැන්ඩි උගුරු දෙකකින් මුව තෙමාගත් ලෝරන්ට්, ඉනික්බිති බෝතලය නැවතත් කොන්ස්ටන් අත තැබීය.

"තොරතුරු වාර්තා කරන්න, මිත්‍රයා," නැපෝලියන් කීවේය.

"අපි හැතැප්ම අටක් දුරට ගියා, සර්. සතුරු හමුදා ගැන නම් සලකුණක්වත් නැහැ. භූමියේ උස අඩුවෙන්න අඩුවෙන්න කාලගුණයත් යහපත් වෙනවා. හිම තට්ටුවේ ගැඹුරත් ඒ වගේම අඩුවෙනවා. මෙතැනින් එහාට වැඩේ පහසු වෙයි."

"හොඳයි... බොහොම හොඳයි."

"තවත් වැදගත් කාරණාවක් තියෙනවා," ලෝරන්ට් කීවේ නැපෝලියන්ගේ බාහුවෙන් අල්ලා පියවර කිහිපයක් දුරට කැටුව යමිනි. "අපිට යමක් හමුවුණා, ජෙනරල්."

"ඉතින්, ඒකෙ ස්වභාවය විස්තර කරන්න ඔබේ කැමැත්තක් නැද්ද?"

"ඔබම ගිහින් ඒ ගැන සොයා බැලුවොත් හොඳයි, ජෙනරල්."

ලෝරන්ට්ගේ මුහුණේ ප්‍රකාශිත හැඟීම් නැපෝලියන් හැඳින්නේය. ඔහුගේ දෑසේ වූයේ යන්තමින් දැල්වුණු අපේක්ෂාවක ඡායාමාත්‍රයකි. ඔහු ලුතිනන්වරයෙකු ලෙස දහසය වැනි වියේදී ෆිරේ ඇර්ටිලෙරිහි සේවය කරන කාලයේ පටන්ම ලෝරන්ට්ව දැනසිටියේය. ලෝරන්ට් කිසිවිටෙකත් අතිශයෝක්තියට හෝ උද්දීපනයට නැඹුරු වූවෙකු නොවීය. ඔහුට හමුවූයේ කුමක් වුවද එය වැදගත් යමක් බැව් නම් නිසැකය.

"කොතරම් දුරද?"

"පැය හතරක ගමනක්."

www.musesbooks.com

Copyrighted Material



නැපෝලියන් අහස්කුස දෙස බැලුවේය. ඒ වනවිට මධ්‍යාහ්නයද එළැඹ තිබිණි. කඳු ශිඛරයට ඉහළින් ඇදී එන අඳුරු වලාකුළු ඔහුට දැකගත හැකි වූවේය. කුණාටුවක් ළඟාවෙමින් තිබිණි. "එහෙම නම්," ඔහු කීවේ ලෝරන්ට්ගේ උරහිසට තට්ටුවක් දමමිනි. "අපි හෙට උදෙන්ම පිටත්වෙනවා."

◈ ◈ ◈

සුපුරුදු දින චර්යාවට අනුව පැය පහක සුව නින්දක් ලැබූ නැපෝලියන්, හිරු උදාවටත් ප්‍රථම පෙරවරු හය වනවිටම අවදිවූවේය. උදේ ආහාරය ලබාගැනීමෙන් අනතුරුව ඔහු සිය කමාන්ඩර්වරුන්ගෙන් ලද පහුගිය රැයේ තොරතුරු හාරාවුස්සන්නට වූයේ, කටුක රසයක් තිබූ කළු තේ පානයකින් උගුර තෙමාගන්නා අතරය. උදෑසන හත වීමට මත්තෙන් ලෝරන්ට්ද සිය භට පිරිස කැටුව පැමිණි අතර, අනතුරුව ඔවුහු පහත්බිම හරහා පෙරදින ලෝරන්ට් අනුගමනය කළ මාවත ඔස්සේ ගමන් කරන්නට වූහ.

පෙරදින රාත්‍රියේ කුණාටුවෙන් තවත් නැවුම් හිම ස්තරයක් නිමැවී තිබිණි. ප්‍රචණ්ඩ ලෙස හමා යන මාරුතය නැපෝලියන් හා ඔහුගේ අසරුවන් වටා සුදුවන් ප්‍රාකාර බඳින්නට විය. අසුන්ගේ ප්‍රශ්වාසය අවකාශයේදී හුමාලය මෙන් දිස්විණි. ඉදිරියට තබන්නා වූ සෑම පියවරක් පාසාම හිම කුණාටුව ක්‍රමයෙන් ඉහළට ඇදෙමින් තිබිණි. අරාබිකරුවාට මඟ සොයාගත හැකිවේ යැයි විශ්වාසයෙන් යුතුව නැපෝලියන්, ස්ටයිරීගේ ග්‍රහණය ලිහිල් කර මවිතයට පත්ව ප්ලාවිතයන් දෙස බලා සිටියදී, සුළං පහර ඔවුන්ගේ මුහුණු මත වක්‍ර සහ සර්පිලාකාර හැඩයෙන් හිම ස්තර බඳින්නට වූවේය.

"ටිකක් භයංකරයි නේද, ජෙනරල්?" ලෝරන්ට් විමසීය.

"හරිම නිශ්ශබ්දයි," නැපෝලියන් මිමිනීය. "මේ වගේ නිහඬතාවක් මම මීට කලින් දැකලා නැහැ."

"ඒක හරිම චමත්කාරජනකයි," ලෝරන්ට් එකඟ විය. "ඒ වගේම, අන්තරාදායකයි."

*හරියට යුදපිටියක් වගෙයි,* නැපෝලියන් සිතුවේය. ජොසෆීන් සමඟ වැතිරුණු සයනය හැරුණුකොට අන් කවර තැනකටත් වඩා යුදපිටිය බොහෝසෙයින් ඔහුගේ නිවහන හා සම විය. කාලතුවක්කුවල ඝෝෂාව, රයිෆලවලින් නැඟෙන වෙඩිහඬ සහ

Copyrighted Material



කටුක වෙඩිබෙහෙත් ගන්ධය... ඔහු මේවාට බොහෝසෙයින් ඇලුම් කළේය. පැවැතියේ මේ දින කිහිපයේ පමාව පමණකි. ඔහු සිතීය. මේ කඳුකර සීමාව පසුකළ ගමන්ම, ඔහුගේ මුවේ ඇඳුණේ සිනාවකි.

මේ අතර ඉදිරියෙන්ම ගමන් කළ අසරුවා, මිටමෙළැවූ අතක් හිසට ඉහළින් ඔසොවමින් නවතින මෙන් සංඥාවක් කළේය. අනතුරුව අසුපිටින් බට අසරුවා, කලවා තෙක් ගැඹුරැති හිම ස්තරය මතින් ඉදිරියට ගමන්ගන්නා අයුරු නැපෝලියන් බලාසිටියේය. ඔහුගේ හිසද ක්‍රමයෙන් පසුපසට නැඹුරු වූයේ ඔහු ප්ලාවිතයන් පරීක්ෂාවට ලක්කරත්මය. අනතුරුව, මාර්ගයේ තිබූ වංගුව තුළට වැදුණු හේ, ඒ ඔස්සේ නොපෙනී ගියේය.

"මිනිහා මොනවද හොයන්නෙ?" නැපෝලියන් විමසීය.

"උදෑසන කියන්නෙ හිම තරණයට එපාමකරපු වෙලාව," ලෝරින්ට් පිළිතුරු දුන්නේය. "රෑ තිස්සෙ හිම තට්ටුවේ මුඳුන් ස්තරය ඝනීභවනය වෙන්නෙ හරියට පිට පොත්තක් වගේ. ඒත් ඇතුළතින් තියෙන හිම තට්ටුව මෘදුයි. එතකොට හිරුඑළිය ඝන වුණු හිම තට්ටුවට වැටුණම ඇතුළෙ හිම ක්‍රමයෙන් දියවෙන්න පටන්ගන්නවා. ඒක කඩාගෙන වැටෙන්න කලින් අපිට ලැබෙන එකම අනතුරු ඇඟවීම, දෙයියො කෝපවෙලා කරන බෙරිහන්දීමක් වගේ ඝෝෂාවක් විතරයි."

නොබෝ වේලාවකින් ඉදිරිපෙළ අසරුවා මාවතේ වංගුව දෙසින් මතුවූවේය. ඉදිරියේ සියල්ල ආරක්ෂිත යැයි ලෝරින්ට්ට සන් කළ හෙතෙම, තම අසු මතට ගොඩවී නැවත ගමන ඇරඹීය.

කඳුකරය පාමුල වූ තවත් කුඩා කඳුගැටයක් හමුවන තුරු ඔවුහු සර්පයෙකු මෙන් දඟරගැසුණු එම නිම්න මාර්ගය ඔස්සේ තවත් හෝරා දෙකක පමණ කාලයක් ගමනේ යෙදුණෝය. අනතුරුව ඔවුන් ප්‍රවිෂ්ට වූයේ හිමෙන් වැසුණු, හැඩ රහිත රළු ග්‍රැනයිට් පාෂාණයෙන් නිමැවුණු කපොල්ලක් තුළටය. එහිදී නැවතත් නවතින ලෙස සංඥා කළ මුල් පෙළ අශ්වාරෝහකයා අසුපිටින් බැසගත්තේය. ඉනික්බිති ලෝරින්ට්ද අසුපිටින් බිමට බට අතර, නැපෝලියන්ද ඔහුව අනුගමනය කළේය.

නැපෝලියන්, අවට සිසාරා බැල්මක් හෙළීය. "මෙතැන?

මේජර්වරයාගේ මුහුණට නැඟුණේ දඟකාර සිනාවකි. "මෙහේ ජෙනරල්." ලෝරින්ට් සෑදලයේ එල්ලාගෙන පැමිණි ලන්තෑරුම් දෙකක් ඉවතට ගත්තේය. "මා පස්සෙන් එන්න."

www.musesbooks.com

Copyrighted Material



ඉදිරියෙන් සිටි අසුන් සයදෙනා පසුකොට ඔවුහු මාවතෙන් පහළට ගමන්ගත්හ. ඊට ඔබ්බෙන් සොල්දාදුවන් පෙළගැසී සිටියේ තම ජෙනරල්වරයාගේ පරීක්ෂාවට ලක්වීමටය. සොල්දාදුවන් පෙළේ අවසානයේ සිට ආරම්භකයා දක්වාම තියුණු ලෙස නිරීක්ෂණය කළ දෙදෙන නතර වූයේ පෝලිමේ ආරම්භකයා අබිමුවය. මිනිත්තු කිහිපයක් ගතවිණි. ඔවුන්ගේ වම්පසට වන්නට නෙරා තිබූ පර්වතයක් අසලින් මතුවුණු සොල්දාදුවෙක් නොහොත් නායක අසරුවෙක් හිම ස්තරය මතින් අපහසුවෙන් මෙන් ඔවුන් දෙසට ඇවිද ආවේය.

"සාජන්ට් පෙලිටියර්ව ඔබට මතක ඇති ජෙනරල්," ලෝරින්ට් කීවේය.

"නිසැකවම," නැපෝලියන් පෙරළා පැවසීය. "මෙහෙයවීම ඔබට භාරයි පෙලිටියර්. පෙරමුණ ගන්න."

ඔහුට ආචාර කළ පෙලිටියර්, තම සැදලයෙන් සිහින් ලණුවක් පිටතට ගෙන ඔහු පාදාදුන්, පපුව පමණ තෙක් ගැඹුරු කානුවක් බඳු මාර්ගය ඔස්සේ ගමන් කළේය. එහි බෑවුම පාදමේ වූ ග්‍රැනයිට්වලින් නිමවුණු පර්වත බිත්තියක් තෙක්ම ඔහු ඔවුන්ව කැඳවාගෙන ගියේය. අනතුරුව එම ප්‍රාකාරයට සමාන්තරව යාර පනහක් පමණ ගමන් කළ හෙතෙම, පර්වත බිත්තියේ ඍජුකෝණී මුල්ලක් අසල නතර වූවේය.

"අපූරු වටපිටාව ලෝරින්ට්! ඒත් මං මොකක් දිහාද මේ බලන්නෙ?" නැපෝලියන් ඇසුවේය.

පෙලිටියර් දෙස බැලූ ලෝරින්ට් හිස සැලීය. සිය හිසටත් ඉහළින් යන සේ ගිනිඅවිය එස වූ හෙතෙම, රයිෆල් මිටෙන් පර්වතයට වැරෙන් පහරක් එල්ල කළේය. අපේක්ෂා කළ, පර්වතයේ වැදී බිඳීයන දැවයෙන් නිමවුණු රයිෆල් මිටේ හඬ වෙනුවට නැපෝලියන්ට ශ්‍රවණය වූයේ අයිස් ස්තරයක ඇති වුණු පිපිරුම් හඬකි. සාර්ථක ප්‍රතිඵලයක් අත්කරගනු වස් මෙලෙස තවත් සිව්වරක් පහරදීමට පෙලිටියර් හට සිදුවිණි. ඉනික්බිති අයිස් ස්තරය බිඳීගියේ පර්වත බිත්තියේ අඩි හයක් පමණ උස් වූ සහ අඩි දෙකක් පමණ පළලැති විවරයක් සකසමිනි.

විවරය තුළට හිස පෙවූ නැපෝලියන් හට දැකිය හැකි වූයේ කැලි කැපිය හැකි ඝන අන්ධකාරය පමණකි.

"මගේ දැනුමෙ හැටියට නම්," ලෝරින්ට් විචාළේය. "ගිම්හාන කාලෙට මේක පඳුරු සහ වැල්ගොන්න යට සැඟවී යනවා ඇති.

MusesBooks

Copyrighted Material



එතකොට සීත කාලෙට විවරය හිමෙන් අවහිර වෙනවා," ලෝරන්ට් කීය. "මං හිතන්නෙ මේක ඇතුළෙ තෙතමනය සහිත තැනක් තියෙන්න ඕනෙ. මේ තුනී අයිස් තට්ටුව ඇතිවෙන්නෙ ඒකෙන්. හැම රැයකම ඒක වැඩිවෙනවා."

"අපූරුයි! කවුද මේක හොයාගත්තෙ?" නැපෝලියන් ඇසුවේය.

"මමයි ජෙනරල්," පෙලිටියර් පෙරළා පැවසීය. "අපි මෙතැන නැවතුණේ අපේ අශ්වයන්ට පොඩි විවේකයක් දෙන්න හිතලා. ඊටපස්සෙ මම... ඇත්තම කිව්වොත් මට වුවමනාවක් ඇති වුණා."

"මට තේරුම්ගන්න පුළුවන් සාජන්ට්. කතාව කියන්න."

"ඇත්තෙන්ම, මං හිතන්නෙ මම ටිකක් ඈතට ආවා ජෙනරල්. ඒක ඉවරවුණාම මම පර්වතය පැත්තට බරවුණා. එතකොටයි මට පිටිපස්සෙන් අයිස් තට්ටුව බිඳිලා මේ පාර හමුවුණේ. මම ඒකෙ තරමක් දුර ගියා. වැඩිය දුරදිග හිතුවෙ නැහැ මට ඒක හම්බෙන තුරුම... මං ඒක ඔබටම දකින්න ඉඩ හරින්නම් ජෙනරල්."

නැපෝලියන්, ලෝරන්ට් දෙසට හැරුණේය. "ඔබ ඇතුළට ගිහින් බැලුවද?"

"ඔව් සර්, මම සාජන්ට් පෙලිටියර් එක්ක මේක ඇතුළට ගියා. ඒ හැරෙන්න වෙන කවුරුත් ගියේ නැහැ."

"එහෙමනම් ලෝරන්ට්, මං ඔබේ පසුපසින් එන්නම්."

◈ ◈ ◈

තවත් අඩි විස්සක් පමණ දුරට විහිදීගොස් තිබූ ගුහා පිවිසුම, ඔවුන් ඉදිරියට ඇවිද යත්ම ක්‍රමයෙන් පටු වන්නට විය. එය හදිසියේම විවර වූවේ, උමං මඟකටය. තමා සිටින්නේ භූගත මාර්ගයක් තුළ බව නැපෝලියන්ට වැටහිණි. ඔහුට පෙර ඇතුළු වී මඳක් ඉදිරියෙන් සිටි ලෝරන්ට් සහ පෙලිටියර් දෙපසට වී, ඔහුට ඉදිරියට යාමට ඉඩහසර සලසා සිය ලන්තෑරුම් ඔසොවාගත්තේ එහි කහ පැහැ ආලෝක ධාරා ගුහා බිත්ති මත පතිත කරමිනි.

දළ වශයෙන් අඩි පනහක් හැටක් පමණ වූ අයිස් මාලිගාවක් බඳු වූ එහි ඇතැම් තැන්වල අඩියක් පමණ ඝනව අයිස් ස්තරයක් බැඳී තිබිණි. සෙසු තැන්වලදී, ගුහාවේ අළු පැහැ ශිලාමය බිත්ති නැපෝලියන් හට අයිස් ස්තරය හරහා යන්තම් දක්නට ලැබිණි. උල් හැඩැති ස්වරූපයෙන් යුතු හිරිගල් කූරු ගුහා පියස්සේ සිට පහළට එල්ලී තිබිණි. පොළොවට ආසන්නවත්ම ඒවා, බිම අයිස් ස්තරය

www.musesbooks.com

Copyrighted Material



මත වැඩී තිබූ එවැනිම උල් හැඩැති හිරිගල් කුළු සමඟ එක්වෙයි. ඒ, පැරැණි වැලි ඔර්ලෝසුවක වන් හැඩයක් මවාපාමිනි. පොළොව සහ බිත්තිවලට සම නොවූ ගුහා පියස්සේ බැඳී තිබූ අයිස් ස්තරය රළු ස්වභාවයක් ගත්තේය. ඒ මතට වැටුණු ලන්තෑරුම් ආලෝකය කරණකොටගෙන එය පහළට දිස්වූයේ තාරුකා පිරිවරාගත් අහස්තලය සේය. ගුහාවේ කොහේදෝ අන්තයකින් වතුර ගලා යන හඬක්ද නැගෙමින් තිබිණි. එසේම, ඈතින් ගලා එන හුළං පහරක හඬද ඇසිණි.

"අපූරුයි!" නැපෝලියන් මිමිනීය.

"මෙන්න මේක තමයි පෙලිටියර්ට ඇතුළුවුණු ගමන්ම දකින්න ලැබුණේ," ලෝරන්ට් කීවේ බිත්තිය දෙසට සමීපවෙමිනි. ලෝරන්ට් බිම වැටී ඇති යමක් වෙත තම ලන්තෑරුම් ආලෝකය යොමුකරමින් හුන් ඉසව්වට නැපෝලියන් පියමැන්නේය. එය පලිහකි.

දළ වශයෙන් අඩි පහක් පමණ උසැති, අඩි පහක් පමණ පළලැති එහි වූයේ අටේ ඉලක්කමේ වන් හැඩයකි. වේවැලින් නිර්මිතව තිබූ එය, රතු සහ කළු කොටු සහිත වර්ණ රටාවක් පින්තාරු කරන ලද සමින් ආවරණය කර තිබිණි.

"ඒක පෞරාණිකයි!" නැපෝලියන් තෙපලීය.

"මං අනුමාන කරන්නෙ අඩුගාණේ වසර දෙදහසක්වත් පැරණියි කියලා," ලෝරන්ට් කීවේය. "මගේ ඉතිහාසය දැනුම නම් ඉස්සර තරම් නැහැ. ඒත් මම විශ්වාස කරනවා, මේක තමා ගෙරෝන් නමින් හඳුන්වන්නෙ කියලා. ඒවා භාවිත කළේ පර්සියානු සොල්දාදුවෝ."

"මොන ඩිඑයූ..."

"තව තියෙනවා ජෙනරල්. මේ පැත්තේ."

හිරිගල් කුළු වනාන්තරය අතරින් මඟ මෙහෙයවමින්, ලෝරන්ට් ඔහුව උමං මාර්ගයේ පසුපස අන්තයේ වූ තවත් කුහර පිවිසුමක් අබිමුවට කැඳවාගෙන ගියේය. අඩි හතරක් පමණ උස් වූ එහි වූයේ ඕවලාකාර හරස්කඩ හැඩයකි.

ඔවුනට පසුපසින්, රැගෙන ආ කඹය බිම හෙළූ පෙලිටියර්, ලන්තෑරුම් ආලෝකයේ ආධාරයෙන් එක් අන්තයක් තොණ්ඩුවක් ලෙස සකස්කොට හිරිගල් කුළක ගැටගැසුවේය.

"මේක අපායට යන පාර වගේනේ!" නැපෝලියන් කීවේය. "අපි පහළට බහිනවද?"

www.musesbooks.com

Copyrighted Material



"අද යන්නෑ ජෙනරල්," ලෝරන්ට් පිළිතුරු දුන්නේය. "එගොඩ වෙන්නයි ඕනෙ."

ලෝරන්ට් සිය ලන්තෑරුම කුහරය දෙසට යොමු කළේය. ඊට අඩි කිහිපයක් ඔබ්බෙන් වූයේ අයිස්වලින් තැනුණු පාලමකි. පළලින් අඩි දෙකකට නොවැඩි එය ග්ලැසියරමය පොළොවේ වූ පැල්මක් මතින් වැටී තිබුණේ එහි අනෙක් අන්තය තවත් උමං විවරයක් තුළ නොපෙනී යන පරිද්දෙනි.

"ඔබ මේක හරහා ගියාද?" නැපෝලියන් ඇසුවේය.

"ඒක ගොඩක්ම සවිමත්. අයිස් තට්ටුවට යටින් තියෙන්නෙ ගලෙන් තැනුණු පොළොව. ඒත් ඔබේ වැඩි ආරක්ෂාවට මෙහෙම කළාට වරදක් නැහැ."

ප්‍රථමයෙන්ම නැපෝලියන්ගේ ඉණ වටා බැඳි රැහැන පරීක්ෂා කළ හෙතෙම, අනතුරුව සිය ඉණේ දැවටූ රැහැන්පොටද පරීක්ෂාවට ලක්කළේය. තොණ්ඩුවක් ආකාරයෙන් සැකසූ අනෙක් අන්තය අවසන් වරටද වැරෙන් ඇද බැම්ම තද කළ පෙලිටියර්, ලෝරන්ට් දෙස බලා හිස සැලීය. "අඩිය තියනකොට බලාගෙන ජෙනරල්,"යි පැවසූ ලෝරන්ට්, උමං විවරය තුළට පා තැබුවේය. තත්පර කිහිපයක් එලෙසින්ම ගතකළ නැපෝලියන්ද අනතුරුව ඔහුව අනුගමනය කළේය.

කෙමෙන් කෙමෙන් ඔවුහු ග්ලැසියර් පැල්ම තරණය කරන්නට වූහ. එහි අඩක් දුර පැමිණි නැපෝලියන් එක් පැත්තක් දෙසට එබිකම් කර බැලුවද, අන්ධකාරය හැර වෙනත් යමක් ග්‍රහණය කරගැනීමට අපොහොසත් වූවේය. එම නිල්වන් පාරභාසක අයිස් ප්‍රාකාර ඇදීයමින් තිබුණේ කෙළවරක් නොපෙනෙන අවසානයක් වෙතටය.

අවසානයේදී අනෙක් අන්තය වෙත ළඟා වූ ඔවුහු, ඉන් අනතුරුව පෙර සිටි උමං මාර්ගයට වඩා ප්‍රමාණයෙන් කුඩා මුත් ඊට වඩා වැඩි උසකින් යුතු වූ ආරුක්කු ආකාර පියස්සක් සහිත ඊළඟ උමං මාර්ගය අනුගමනය කරන්නට වූහ. ලන්තෑරුම අත දරාගෙන පෙරමුණේ ගමන් කළ ලෝරන්ට්, අයිස් මිදී ඇති හිරිගල් කුළු දෙකක් ලෙස දිස් වූ නෙරීම් යුගලයක් අසල නතර වූවේය. අඩි දොළහක පමණ උසින් යුතු එම ගල්කුළු ගුහාවේ පියස්සෙන් වෙන්ව පැවැතිණි.

නැපෝලියන්, ඉන් එකක් අසලට ගමන් කළේය. අසල නැවතුණු ඔහු ඇස් කුඩා කරමින් එය පරීක්ෂා කළේය. අයිස් මිදී

Copyrighted Material



තිබූ ස්තම්භයක් වූ එය, කිසිසේත්ම හිරිගල් නෙරුමක් නොවීය. සිය අත්ල ඒ මත තැබූ ඔහු ඒ දෙසට තවත් නැඹුරු වූවේය.

අයිස් මිදුණු නෙරුම තුළ සිට ඔහු දෙස බලාසිටියේ කාන්තාවකගේ රන්වන් පැහැති මුහුණකි.

MusesBooks

www.musesbooks.com

Copyrighted Material

# පරිච්ඡේදය 01

**ග්‍රේට් පොකෝමෝක් වගුරුබිම,**
**මේරිලන්ඩ්.**
**වර්තමානය**

වකුටු වී සිටි සෑම් ෆාර්ගෝ නැඟීහිඳ, තවමත් ඉණක් පමණ ගැඹුරැති කාලවර්ණ මඩ ගොහොරුවේ රැඳී සිටින තම බිරිඳ දෙස බැලුවේය. ඈ පැලඳ සිටි දීප්තිමත් කහ පැහැති චෙස්ට් වේඩරය ඇගේ තඹවන් වරලස සමඟ මනාව ගැළපිණි. ඔහුගේ බැල්ම තමා දෙසට යොමුව ඇති බව ඇයට වැටහිණ. දෙතොල පෙරළා අප්‍රසාදය පළකරමින් ඔහු දෙසට හැරුණු ඕ, මුවෙන් සුළං පහරක් පිටකළේ තම කම්මුලක් මත වැටී තිබූ කෙස් කලඹ ඉවතට යන ලෙසිනි. "මෙතැන තමුන්ට හිනායන්න තරම් කාරණය මොකක්ද ෆාර්ගෝ?" ඈ විමසීය.

ඈ මුල්වරට වේඩරය පැලඳගත් විට, 'ගෝර්ටන්වල මසුන් අල්ලන්නෙක් වගේ,' යැයි පවසමින්, ඔහු කලින්ම කට වරද්දාගෙන සිටියේය. ඊට පිළිතුරු ලෙස ඔහුට ලැබුණේ මිලානව ගිය බැල්මකි. පසුව ඔහු එහි මුලට 'සරාගී' යන වචනය එක්කළද මුල් ප්‍රතිචාරයට එතරම් බලපෑමක් එක්කිරීමට එය අපොහොසත් විය.

"ඔයා," ඔහු පෙරළා පැවසීය. "ඔයා හරි ලස්සනයි... ලෝන්ග්ස්ට්‍රීට්." අමනාපයෙන් පසුවන බොහෝ විටෙක නමේ අග කොටසින් ඔහුව ඇමතීමේ පුරුද්දක් රෙමීට තිබිණි. එවිට ඔහුද

www.musesbooks.com

Copyrighted Material



ඇගේ විවාහයට පෙර නම වූ 'ලෝන්ග්ස්ට්‍රීට්' යන්න භාවිත කරමින්, ඇයට ප්‍රතිචාර දැක්වීමට සැමවිටම උත්සුක විය.

"ඔයාට හොඳටෝම පිස්සු. මගේ මූණ පුරාම මදුරුවෝ කාපු පැල්ලම්. මගෙ කොණ්ඩෙත් එකට ඇලිලා හරියට කඩදාසියක් වගේ." වැළමිට දක්වා මඩෙන් වැසීගිය අතක් ඉහළට ඔසවා, නැඟෙන සිනාව සඟවාගැනීමට යත්න දරමින් ඇ කීවාය. අනතුරුව ඇය එම අතින්ම සිය කම්මුලක් පහුරුගෑවේ මඩ පැල්ලමක් මුහුණේ ඉතිරිකර හරිමිනි.

"ඔයාගෙ ලස්සනට ඒක නියමෙට ගැළපෙනවා."

"බොරුකාරයා!"

ඇගේ මුහුණේ යම් කලකිරීම්සහගත බවක් රැඳී තිබුණද, රෙමී පසුබෑමට ලක්කළ නොහැකි බැව් සෑම් දැනසිටියේය. ඇය ඉලක්කගත යමක් තීරණය කළ පසු කිසිදු බාධකයකට ඇයව අධෛර්යමත් කිරීමට හැකියාවක් නොවීය.

"ඇත්තම කිව්වොත්," ඇය කීවාය. "මට පේනවා අද ඔයාට ටිකක් හදිස්සි වෙලා වගේ කියලා."

සිය කඩමාලු වූ පැනමා හිස්වැසුම ඇය වෙතට විසිකළ සෑම්, නැවතත් යෙදීසිටි කටයුත්තේම නියැළුණේ, නිදන් මංජුසාවක් යැයි ඔහු අනුමාන කළ මඩවගුරේ ගිලී සිරව ඇති ලී පටිය වටා වූ මඩතට්ටුව කලතමිනි.

ගෙවුණු තෙදිනක කාලය ඔවුහු වැයකළේ, මෙලෙස මඩවගුර පීරමින් ඔවුන්ගේ ප්‍රයත්නය නිෂ්ඵල වල් තාරාවන් ලුහුබැඳීමක් අරබයා යොමුවූවක් නොවන බවට සනාථ කළ හැකි සාධකයක් සොයමිනි. ඔවුන් දෙදෙනාගෙන් කිසිවෙකුත් එය ඉස්තරම්ම තාරා දඩයමක් විය යුතුයැයි අපේක්ෂා නොකළද, නිදන් දඩයමත් සමඟ එය නිතැතින්ම බැඳී පැවැතිණි. නමුත් අවසානයේදී කෙසේ හෝ, හඹාගිය තාරාවා ග්‍රහණය කරගැනීම සැමවිටෙකම පාහේ හොඳම ප්‍රතිඵලය විය.

මෙවර නම් ඔවුන් දඩයමේ යෙදෙන වස්තුව රැඳී තිබුණේ නොපැහැදිලි පුරාවෘත්තයක් මතය. ඊට යාබදව පිහිටි චෙසාපීක් සහ ඩෙලාවෙයාර් මුහුදු තීරයන්හි මුහුදුබත් වුණු නැව් භාරදහසකට ආසන්න ගණනක අවසන් නවාතැන බවට පත්ව තිබුණද, සෑම් සහ රෙමී හඹා යන දඩයම, ගොඩබිම මූලික කරගත්තක් විය. මසකට ඉහතදී ටෙඩ් ෆ්‍රොබිෂර් නොහොත් ප්‍රින්සස් ඈන්හි සිය

Copyrighted Material



කෞතුක වස්තු ව්‍යාපාරය කෙරෙහි වැඩි අවධානයක් යොමුකරනු වස් වෘත්තියෙන් විශ්‍රාමගත් ඔවුන් දැන හඳුනන තවත් නිදන් සොයන්නෙකු විසින් ඔවුන් වෙත එවනු ලැබ තිබුණේ, කුතුහලය දනවන සම්භවයක් තිබූ කාන්තා ආභරණයකි.

එයට තිබුණේ පෙයාර්ස් ගෙඩියක හැඩයකි. රනින් සහ හරිතවන් ජේඩ් පාෂාණයෙන් නිමැවුණු එය, කුප්‍රකට අපරාධකාරියක වූ මාර්තා 'පැටී' කැනන්ගේ පළමු ගොදුර වූ හෙන්රියාටා බ්‍රන්සන් නම් ස්වදේශික කාන්තාවට අයත්ව තිබූ ආභරණයක් විය.

පුරාවෘත්තයට අනුව මාර්තා කැනන් යනු, ක්‍රි.ව. 1820දී පමණ විසූ, රළු ගතිපැවතුම් ඇති කුරිරු කාන්තාවකි. තම සහචරයන්ද කැටිව ධනවතුන් මෙන්ම දුප්පතුන්ද කොල්ලකෑමේ සහ ඝාතනයේ යෙදෙමින්, මුළු මහත් චෙසාපීක් සහ ඩෙලාවෙයාර් සීමාවම භීෂණයේ ගිල්වා තැබීමට ඕ සමත් වූවාය. එමෙන්ම, වර්තමානයේ රිලයන්ස් නමින් හැඳින්වූ, එකල ජොන්සන්ස් කෝනර් ලෙසින් ප්‍රකට වූ තානායමද ඈ විසින් පවත්වාගෙන යනු ලැබූවක් විය.

නිබඳවම සිය තානායමට සංචාරකයන් ආකර්ෂණය කරගන්නා මාර්තා කැනන්, ඔවුන්ට ආහාර, විනෝදාස්වාදය සපයා යහන්ගත කරන්නේ, මධ්‍යම රාත්‍රියේදී ඔවුන්ගේ දිවි තොරකිරීමට මත්තෙනි. පසුව ඈ එම මළසිරුරු බිම්මහල වෙත ඇදගෙන ගොස්, මරාදැමුණු මිනිසුන් සතු වටිනා දෑ සොරාගෙන, දැව ගොඩවල් මෙන් මුල්ලක ගොඩගසයි. කරත්තයක පැටවීමට ප්‍රමාණවත් තරම් මළසිරුරු එහි ගොඩගැසුණු පසු, ඇය ඔවුන්ව සමූහ වශයෙන් භූමදානය කළේ යාබද වනාන්තරය තුළය. මේවා අතිබිහිසුණු අපරාධ ලෙස පෙනීගියද, ඇගේ දරුණුතම අපරාධ අතරට ගැනුණේ ඊටත් පසුකාලීනව ඈ විසින් කරන්නට යෙදුණු අපරාධයි.

එසේම කැනන් විසින් ස්වදේශික ඉතිහාසඥයන් 'රිවර්ස් අන්ඩර්ග්‍රවුන්ඩ් රේල්රෝඩ්' ලෙස හැඳින්වූ වහල් වෙළෙඳ ව්‍යාපාරයක්ද එම ප්‍රදේශයේ ස්ථාපිත කරවනු ලැබ තිබිණි. ඔවුන් විසින් දකුණු ප්‍රදේශවල නිදහස ලත් වහල් සේවකයන් පැහැරගෙන ගොස් ඔවුන්ව තානායමේ සැඟවුණු කුටිවල සහ එහි තාවකාලික සිරමැදිරිවල රඳවා තබනු ලැබූ අතර, පසුව ඔවුන්ව හොරරහසේම කැනන්ගේ තොටුපළ වෙත ප්‍රවාහනය කෙරුණේ රාත්‍රි අන්ධකාරයේ පිටිවහලද ඇතිවය. එහිදී ඔවුන්ව නැන්ටිකෝක් ගංගාවේ පහළට

www.musesbooks.com

Copyrighted Material



යාත්‍රාකරන නෞකාවලට පටවනු ලැබූයේ, ජෝර්ජියානු වහල් වෙළෙඳපොළේදී විකුණාදැමීමේ අටියෙනි.

1829දී කැනන්ගේ වගාබිමක සිදු වූ වගා වළවල් කැණීමේ කටයුත්තකදී, කොටස් වශයෙන් වළ දමා ඇති මළසිරුරු කිහිපයක් සේවකයෙකුට හමුවිය. එම සිදුවීමෙන් අනතුරුව වැඩිකල් නොගොස්ම, මාර්තා කැනන්ට මිනීමැරුම් සම්බන්ධයෙන් චෝදනා එල්ල විය. පසුව ඇගේ වරදකාරිත්වයද සනාථ වූයෙන්, ඇයව ජීවිතාන්තය තෙක් සිරගත කෙරිණි. ඊට සිව් වසරකට පසුව, ඈ සිය සිරමැදිරිය තුළම මරු වැලඳගෙන තිබියදී හමුවිය. ඇය ආර්සනික් නම් විෂ වර්ගය පානය කර සියදිවි හානිකරගෙන තිබූ බව එවකට සිටි බොහෝදෙනාගේ මතය විය.

වසර කිහිපයක ඇවෑමෙන්, කැනන්ගේ අපරාධ සහ ඇගේ මරණයද මිථ්‍යාවක් බවට හැරවිණි. සිරගෙදරින් පලා යාමට සමත් වූ ඇය, සුපුරුදු පරිදි දුප්පතුන් කොල්ලකමින් සහ ඝාතනයේ යෙදෙමින්, අනූ වන විය පමණ වනතෙක් විසූ බවටද කටකතා පැතිරිණ. එසේම, කඳු නඟින්නන් මංකොල්ලකෑමේ නිරතවන ඇගේ අවතාරය පිළිබඳව නොයෙකුත් මතිමතාන්තරද ඩෙල්මාර්වා, පෙනිසියුලා ප්‍රදේශවල කඳු තරණයකරන්නන් අතර හුවමාරු විය. මේ අතර කැනන්ගේ වස්තු සම්භාරයෙන් ඈ වියපැහැදම් කර තිබුණේ අඩක් පමණක් බවත්, ඉතිරි කොටස තවමත් අස්ථානගතව පවතින බවත්, තවත් සුළුතරයකගේ විශ්වාසය වූවේය. තක්සේරුවට අනුව එහි වර්තමාන වටිනාකම අමෙරිකානු ඩොලර් ලක්ෂයත්, ලක්ෂ හතරත් අතර ගණනකි.

පැටී කැනන්ගේ නිධානය පිළිබඳ පුරාවෘත්තය මුල සිටම සෑම් සහ රෙමීගේ සවනත වැකී තිබිණි. එහෙත් ආරම්භයක් ගැනීමට තරම් ශක්තිමත් සාධක නොමැතිවීමෙන් ඔවුහු එය 'පසු-කලෙක' යැයි සඳහන් කළ ගොනුව තුළ බහාතැබුවෝය. එහෙත් හදිසියේ පහළවුණු හෙන්රියාටා බ්‍රන්සන්ගේ ආභරණයත්, මෙහෙයුමේ ආරම්භක ලක්ෂ්‍යය නිර්ණය වූ පැටලුණු නූල් බෝලයේ හරිහමන් කෙළවරත් අතට හසු වූ පසු, ඔවුහු එම අබිරහසේ සුලමුල සෙවීමේ තීරණයට එළැඹුණහ.

පොකෝමෝක්හි පැරැණි සිතියම් සහ කැනන්ගේ රහස් තිප්පොළ පිහිටි ස්ථාන, ඔවුන්ට ලැබුණු ආභරණය හමුවූවා යැයි සැලකෙන ස්ථානයත් සමඟ සසඳා බලමින් කළ විස්තරාත්මක

MUSESBOOKS

www.musesbooks.com